(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 184.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2017 ජූලි මස 28 වැනි සිකුරාදා පූ. භා. 10.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

863/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂය තුළ ශ්‍රී ලංකාවට ආනයනය කළ රටඉඳි ප්‍රමාණය කොපමණද;

(ii) ශ්‍රී ලංකාව රටඉඳි ආනයනය කරන ප්‍රධාන රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රටඉඳි ආනයනයේදී එහි ප්‍රමිතිය පිළිබඳ පරීක්ෂා කරන්නේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

(iii) 2015 වර්ෂයේදී රටඉඳි ආනයනය සඳහා වැය කළ මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1071/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1983 ජූලි සහ අගෝස්තු මාසයන්හි සිදු වූ ජාතිවාදී කෝලහල හේතුවෙන්,

(i) මියගිය, තුවාල සිදු වූ සහ අවතැන් වූ දමිළ පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන් පදිංචිව සිටි දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මියගිය, තුවාල සිදු වූ සහ අවතැන් වූ මුළු දමිළ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1117/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක දිවිනැගුම ප්‍රජා මූල බැංකු (සමෘද්ධි බැංකු) සංඛ්‍යාව කොපමණද;

(ii) එම බැංකු පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) එක් එක් බැංකු ශාඛාවෙන් ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ (i) හි සඳහන් එක් එක් බැංකුවක සේවයේ නියුතු සේවකයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) දැනට එම බැංකුවල සේවක පුරප්පාඩු තිබේද;

(iii) එසේ නම්, එම පුරප්පාඩු සඳහා සේවකයන් බඳවා ගැනීමේ ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1161/'16

ගරු බිමල් රත්නායක මහතා,— තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කහල්ල, පල්ලෙකැලේ සහ හක්වටුනා ජලාශය පදනම් කරගෙන සංචාරක කලාපයක් නිර්මාණය කිරීමේ සැලැස්මක් තිබේද;

(ii) එසේ නම්, එම සැලැස්ම ඉදිරිපත් කරන්නේද;

(iii) කහල්ල වන රක්ෂිතය සහ අභය භූමි ප්‍රදේශය තුළ මාර්ග සහ ගොඩනැගිලි ඉදිකිරීමේ සැලැස්මක් තිබේද;

(iv) එසේ නම්, ඒ කුමක් සඳහාද; කොපමණ ප්‍රමාණයක්ද; කවර ස්ථානවලද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කහල්ල වන රක්ෂිතය තුළ මේ වනවිට අක්කර 06 ක පමණ භූමි ප්‍රදේශයක් කැලෑව ඉවත් කරමින් යන්ත්‍රානුසාරයෙන් සකස් කිරීමට හේතුව කවරේද;

(ii) ඒ සඳහා මුදල් වෙන් කළ ආයතනය කුමක්ද; එම මුදල කොපමණද;

(iii) එහි කොන්ත්‍රාත්කරුවන් කවුරුන්ද;

(iv) මේ තුළින් 2009 අංක 65 දරන පනතකින් අවසන්වරට සංශෝධිත 1907 අංක 6 දරන වන සංරක්ෂණ ආඥා පනතේ 7 වගන්තිය උල්ලංඝනය වන බව රජය පිළිගන්නේද;

(v) එම වගන්තිය උල්ලංඝනය කළහොත් ලබාදිය හැකි දඬුවම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1194/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1983 වර්ෂය වනවිට වව්නියාව දිස්ත්‍රික්කය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 1984 සිට 2009 දක්වා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) 2009 වර්ෂයේදී යුදමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂ දක්වා විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් කාල පරිච්ඡේදය සඳහා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1298/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, ජාතික සහ පළාත් පාසල්වල සේවය කරන අනධ්‍යයන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මාතර දිස්ත්‍රික්කයේ ජාතික සහ පළාත් පාසල්වල පවතින අනුමත අනධ්‍යයන සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම පුරප්පාඩු සංඛ්‍යාව, ජාතික සහ පළාත් පාසල් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට පියවර ගන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා අදාළ වන බඳවා ගැනීමේ පටිපාටිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1383/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 147 අනුව, මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සඳහා, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු. 50/= දක්වා වැඩි කිරීමෙන්, රාජ්‍ය අය භාරයට වූ දායකත්වය කවරේද;

(ii) 1977 සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන ප්‍රමාණය සහ එහි ආනයන වටිනාකම එක් එක් වර්ෂය අනුව කවරේද;

(iii) රේගු දත්ත අනුව, ශ්‍රී ලංකාවට මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය කරනු ලබන ආනයනකරුවන්ගේ නම් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(iv) ශ්‍රී ලංකාවට මාළු ආනයනය කිරීම අඩු කිරීම සඳහා රජයට කිසියම් වැඩ පිළිවෙළක් තිබේද;

(v) එසේ නම්, එය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1480/'16

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කය තුළ ක්‍රීඩා පාසල් පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් සංවර්ධනය කිරීම සඳහා ගන්නා පියවර කවරේද;

(iv) දැනට පුත්තලම දිස්ත්‍රික්කය තුළ සේවයේ නියුතු ක්‍රීඩා ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ගේ නම් සහ සේවයේ නියුතු පාසල් කවරේද;

(vi) දිස්ත්‍රික්කය තුළ ක්‍රීඩා ගුරු පුරප්පාඩු පවතී නම්, ඉදිරියේදී එම පුරප්පාඩු සඳහා අවශ්‍ය බඳවා ගැනීම් සිදු කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1495/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාන්ඔය ව්‍යාපෘතිය සඳහා අවට පදිංචි ප්‍රදේශවාසීන්ගේ ඉඩම් අත්කර ගැනීම හේතුවෙන් පාරම්පරික වැව් 07 ක්, ගේදොර සහ කුඹුරු මෙම ජලාශයට යටවීම නිසා එම පිරිස ඉඳුම් හිටුම් නොමැතිව අසරණ තත්ත්වයට පත්වී ඇති බවත්;

(ii) ප්‍රදේශවාසීන්ගේ විරෝධය නොතකා ජන ජීවිතයට නුසුදුසු කජුවත්ත ප්‍රදේශයේ විශාල ඝන වනාන්තරයක් ඔවුන්හට බෙදා දීමට නිලධාරීන් විසින් කටයුතු කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ප්‍රදේශවාසීන් විසින් මල්පෝරුව ගම්මානය අසල, දකුණු ඇළට යාබදව, ජලාශයට යටනොවූ ඉඩම් අක්කර 600ක ප්‍රමාණයෙන් අක්කර 200ක් ලබා දෙන ලෙස ඉල්ලා සිටි බවත්;

(ii) ඒ අනුව, විෂය භාර අමාත්‍යවරයා අදාළ නිලධාරීන් සමඟ පැමිණ ඉහත කී ඉඩමෙන් අක්කර 200ක ගොඩ ඉඩම් හැකි ඉක්මනින් එම ජනතාවට ලබාදෙන ලෙස ඔවුන්ට උපදෙස් දුන් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ වුවද, මේ දක්වා ඔවුන්ට පදිංචිය සඳහා ඉඩම් නොලැබී ඇති බැවින්, ඉහත ආ (ii) හි තීරණය අනුව වහාම ඉඩම් ලබා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1498/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2017 අයවැය සඳහා ජනතාවගෙන් අදහස් හා යෝජනා ලබාගැනීම වෙනුවෙන් රූපවාහිනී, ගුවන්විදුලි සහ පුවත්පත් දැන්වීම් සඳහා වියදම් කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1597/'17

ගරු විදුර වික්‍රමනායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනේ ජනප්‍රිය පාසල්වලට, විශේෂයෙන්, ජාතික පාසල්වලට දරුවන් ඇතුළත් කිරීම සඳහා දැඩි තරඟකාරීත්වයක් පවතින බවත්;

(ii) මේ හේතුවෙන් අපහසුතාවයට පත්වන දෙමාපියන් තම දරුවා එම පාසල්වලට ඇතුළත් කරගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට ද ඉල්ලීම් ඉදිරිපත් කරන බවත්;

(iii) දෙමව්පියන් පිරිසකගේ එවැනි ඉල්ලීමක් සලකා බලා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් හොරණ තක්ෂිලා මධ්‍ය විද්‍යාලයේ විවිධ ශ්‍රේණි සඳහා ඇතුළත් කර ගැනීම පිණිස සිසුන්ගේ නාම ලේඛනයක් විදුහල්පතිතුමියට එවා ඇති බවත්;

(iv) එම නාම ලේඛනයේ ඇතුළත් නම් අතරින්, ප්‍රමුඛතාවය ලබාදීම සඳහා විදුහලේ සංවර්ධන කටයුතු සඳහා රුපියල් ලක්ෂ පහක මුදලක් අපේක්ෂා කරන බව සමහර දෙමාපියන් වෙත ආදි ශිෂ්‍ය නියෝජිතයන් වශයෙන් සිටින ඇතැම් පුද්ගලයන් විසින් දන්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) විශේෂයෙන්ම දුප්පත් දරුවන්ගේ අනාගත අභිවෘද්ධිය උදෙසා නිදහස් අධ්‍යාපනයේ පියා විසින් ආරම්භ කරන ලද මධ්‍ය විද්‍යාල මෙලෙස මුදල් පසුපස හඹායාම බරපතල වරදක් මෙන්ම, බරපතල අසාධාරණයක් වන බවත් එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මේ සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව කටයුතු කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1601/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය යල් පැන ගොස් ඇති බව දන්නේද;

(ii) ශ්‍රී ලංකාවේ කාලීන සහ අනාගත අපේක්ෂාවන් සඳහා ගැලපෙන ජාතික බලශක්ති ප්‍රතිපත්තියක් අවශ්‍ය බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එම නව ජාතික බලශක්ති ප්‍රතිපත්තිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1604/'17

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා,—විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ලංකා විදුලිබල මණ්ඩලයට සැපයීම සඳහා විදුලිය උත්පාදනය කරනු ලබන විදුලි බලාගාර කවරේද;

(ii) එම එක් එක් බලාගාරයේ විදුලි උත්පාදන ධාරිතාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් බලාගාරයෙන් විමෝචනය වන පරිසරයට හානිකර වායූ පිළිබඳ තක්සේරුවක් කර තිබේද;

(iv) පරිසර හිතකාමී ක්‍රමවේද භාවිතා කිරීම මඟින් කොළඹ නගරය ඇතුළු බස්නාහිර පළාතට විදුලිය ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1610/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රක්වාන මැතිවරණ කොට්ඨාසයේ, පල්ලෙබැද්ද - බලංගොඩ ප්‍රධාන මාර්ගය විශාල පිරිසක් දෛනිකව භාවිතා කරන බවත්;

(ii) වසර ගණනාවකින් මෙම මාර්ගයෙහි කිසිදු ප්‍රතිසංස්කරණයක් සිදු කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම මාර්ගය සංවර්ධනය කිරීමට අවශ්‍ය ඉදිරි පියවර ගැනීම සඳහා ගතවන කාලය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

891/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රන්, රිදී හා යකඩ ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන කර්මාන්තකරුවන් පාරම්පරිකව, ජීවත් වන ප්‍රදේශ පිළිබඳ සමීක්ෂණයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ග්‍රාම නිලධාරි වසම්වල, ජීවත්වන උක්ත කර්මාන්තයේ පාරම්පරිකව යෙදෙන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම කර්මාන්තකරුවන් මුහුණ දෙන ප්‍රධාන ගැටලු පිළිබඳ අධ්‍යයනයක් කර තිබේද;

(v) එසේ නම්, එම ගැටලු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත කර්මාන්තකරුවන්ට අවශ්‍ය නව තාක්ෂණය හා පුහුණුවීම් ලබාදීමට කටයුතුකර තිබේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

(iii) නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අවශ්‍ය වෙළඳපොළ සපයාදීමට රජය මැදිහත් වී තිබේද;

(iv) එසේ නම්, ඒ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම කර්මාන්තකරුවන් සඳහා විදේශ රැකියා අවස්ථා ලබාදීමට වැඩපිළිවෙළක් තිබේද;

(ii) නොඑසේ නම්, වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

(iii) උක්ත නිෂ්පාදන අපනයනය කරන්නේද;

(iv) එසේ නම්, එම රටවල් කවරේද;

(v) 2015 හා 2016 වර්ෂයන්හිදී මෙම භාණ්ඩ අපනයනයෙන් ලැබූ ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2016.03.08 වන දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 10.30 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. පූ. භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තැබිය යුතු ය.

2\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2016.03.08 වන දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, 2017 අගෝස්තු මස 04 වැනි සිකුරාදා පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන දිනයක් විය යුතු ය. එදින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 10.30 සිට අ. භා. 12.30 දක්වා විය යුතු ය. අ. භා. 12.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තැබිය යුතු ය.

3\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2017 අගෝස්තු මස 04 වැනි සිකුරාදා පූ. භා. 10.30 වන තෙක් කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2017 ජූලි 27),— "1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය යටතේ පෙට්‍රෝලියම් නිෂ්පාදන හා ද්‍රව වායු ඇතුළු සියලුම ඉන්ධන සැපයුම හා බෙදා හැරීම සහ රේගු ආඥා පනතේ අරමුණු සඳහා වරායක් ලෙස නිර්වචනය කර ඇති ඕනෑම වරායක් තුළ නැවකින් තෙල් හෝ ඉන්ධන බැහැර කිරීම, ප්‍රවාහනය කිරීම, ගොඩ බෑම, ගබඩා කිරීම, භාරදීම හෝ ඉවත් කිරීමට අදාළව සිදු කළ යුතු හෝ අත්‍යාවශ්‍ය වන සියලුම සේවාවන්, වැඩ හෝ ඕනෑම ආකාරයක ශ්‍රමය යෙදවීම යන සේවාවන් සැපයීමෙහි නිරත වන ඕනෑම රාජ්‍ය සංස්ථාවකින් හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ සමූපකාර සමිතියකින් හෝ ඒවායෙහි ශාඛාවකින් සපයනු ලබන සේවාවන් සාමාන්‍ය ජන ජීවිතය පවත්වා ගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය වන බව සැලකිල්ලට ගනිමින් හා එම සේවාවන් සැපයීමට අවහිරයක් හෝ බාධාවක් ඇති වීමට හැකියාවක් පැවතීම හේතුවෙන් ඕනෑම රාජ්‍ය සංස්ථාවකින්

හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ සමූපකාර සමිතියකින් හෝ ඒවායෙහි ශාඛාවකින් සපයනු ලබන සේවාවන් ඉහත කී වගන්තියෙහි කාර්යයන් සඳහා අත්‍යාවශ්‍ය සේවාවන් බවට ජනාධිපතිවරයා විසින් 2017 ජූලි 25 දිනැති අංක 2029/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයක් මඟින් 2017 ජූලි 25 දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී. (2017 ජූලි 26 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. )"

*2.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ නියෝග,— 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 6 වගන්තියේ (ඉ) ඡේදය සහ 21 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 51 වගන්තිය යටතේ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 දෙසැම්බර් 06 දිනැති අංක 1996/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.06.07 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*3.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2017 මාර්තු 08) [1].

*5.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

දේශීය ආදායම් පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවට හා 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 3 හා 3 (4) වගන්ති ප්‍රකාරව, මානව හිමිකම් ක්ෂේත්‍රය පිළිබඳ පෘථුල දැනුමක් හා ප්‍රායෝගික අත්දැකීම් සහිත පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ නීති දෙපාර්තමේන්තුවේ අංශාධිපතිනිය ලෙස සේවය කරන ආචාර්ය නෙළුම් දීපිකා උඩගම මහත්මිය, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති ලෙස වසර තුනක (03) කාලයක් සඳහා 2015.10.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජනාධිපතිවරයා විසින් පත්කර ඇති හෙයින්ද;

2015.10.30 දින සිට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති ලෙස කටයුතු කරන ආචාර්ය නෙළුම් දීපිකා උඩගම මහත්මිය වසර තුනක (03) සේවා කාලයෙන් පසු නැවත සිය නිත්‍ය තනතුරට යාමට අදහස් කරන අතර, මෙම වසර තුනක (03) සේවා කාලය තුළ සියලු දීමනා ඇතුළත් විශ්වවිද්‍යාල වැටුප ඇයට අහිමි වුවහොත් ඇයගේ සේවක ප්‍රතිලාභ කෙරෙහි අහිතකර බලපෑමක් සිදුවන බව ඇය විසින් දන්වා ඇති හෙයින්ද;

ඊට අනුකූලව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වත්මන් සභාපතිනිය වන ආචාර්ය නෙළුම් දීපිකා උඩගම මහත්මිය වෙත ඇයට පෞද්ගලික වන සේ ඇය සේවය කරන පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නීති දෙපාර්තමේන්තුවේ අංශාධිපතිනිය ලෙස සියලු දීමනා ඇතුළත් පූර්ණකාලීන කථිකාචාර්ය මාසික වැටුප 2015.10.30 දින සිට ගෙවීමටත්, කොමිෂන් සභාවේ සභාපති තනතුරට හිමි රු.10,000/-ක මාසික දුරකථන දීමනාව, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් සහ එකී වාහනය සඳහා ඉන්ධන ලීටර් 225ක් හෝ වෙළඳපොලේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක් ගෙවීමටත් 2017.06.13 දින අමාත්‍ය මණ්ඩලය අනුමතිය ලබා දී ඇති හෙයින්ද;

ඊට අනුකූලව, 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිනිය වන ආචාර්ය නෙලුම් දීපිකා උඩගම මහත්මිය වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ වෛද්‍ය උපකරණ මිල නියම කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 පෙබරවාරි 17 දිනැති අංක 2006/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*12.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*15.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝගය,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 60 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 61 වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මාර්තු 27 දිනැති අංක 2012/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

16.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

17.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

18.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

19.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

20.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

21.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

22.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---